Department of Education Sabaragamuwa province' Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

සතිය - 07

විෂය - නර්තනය

ශ්‍රේණිය - 07

prepared by- බලංගොඩ කලාප අධ්‍යාපන කාර්යාලය

# දවුල



* මෙය සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ අතරින් සබරගමු නර්තන සම්ප්‍රදාය සඳහා යොදාගන්නා ප්‍රධාන සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩයයි.
* පංචතූර්ය වර්ගීකරණයේදී විතතාත වර්ගයට අයත් වාද්‍ය භාණ්ඩයකි. (එක් අතකින් සහ කඩිප්පුවකින්). දැතින්ම වයන අවස්ථාද ඇත.
* දවුලට ඉතා දීර්ඝ ඉතිහාසයක් ඇත.
* ලංකාවේ ඉපැරණි ජන කොටසක් වන වැදි ජනයා අතර පවතින්නේ දවුලට සමාන සිලින්ඩරාකාර බෙරයකි.
* දඹදෙණි අස්නෙහි ''ලෝහ දවුල්, පීන දවුල්, මහ දවුල් ......'' යනුවෙන් දවුල් වර්ග කීපයක් නම් කර ඇත.

# දවුලේ පරිමිතිය හා සැකැස්ම

- කඳෙහි වට ප්‍රමාණය - අඟල් 45
- කඳෙහි දිග - අඟල් 15

➢ **දවුලේ උපත පිළිබඳව මෙසේ සඳහන් වෙයි.**

**කඳ දිග පසළොස් අඟුලේ**
**වට හතළිස් පස් අඟුලේ**
**ඒ දැක රුසි නියම කළේ**
**මේ ලෙස නියමයි දවුලේ**



## දවුල භාවිතා වන අවස්ථා

- ❖ ආගමික අවස්ථාවලදී
  - හේවා හේවිසි
  - පෙරහැර
- ❖ සන්නිවේදන කාර්යය සඳහා
  - හේවිසි
  - මළබෙර
  - රණබෙර
  - අණබෙර
- ❖ සමාජයීය කටයුතු සදහා
  - ශාන්තිකර්ම
- ❖ අධ්‍යාපනික අවශ්‍යතාවයන් සඳහා



**පැවරුම**

1. අතීතයේදී දවුල භාවිතා කළ ආගමික අවස්ථා දෙකක් ලියන්න.

2. අතීතයේදී සන්නිවේදන කාර්යය සඳහා දවුල යොදාගත් වාදන අවස්ථා 4 ක් ලියන්න.

3. සබරගමු ශාන්තිකර්ම සඳහා යොදා ගන්නා ප්‍රධාන සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩය කුමක්ද?

4. දවුල් ඇස සෑදීමට ගන්නා සම් වර්ග දෙකක් නම් කරන්න.

5. දවුල් වාදනය සඳහා උපකරණයේ/ආධාරකයේ නම කුමක්ද?

6. දවුලේ රූප සටහනක් ඇඳ කොටස් නම් කරන්න.